# කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


**නිවේදන අංකය : 02** **WW/O/21/11/24/02**
**වර්ණය : ඇම්බර්**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් ඇතිවීම පිලිබඳව ධීවර සහ නාවික ප්‍රජාව සඳහා වන නිවේදනය**
**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2021 නොවැම්බර් මස 25 වන දින ප.ව 2.30 තෙක් වලංගු වන පරිදි නොවැම්බර් මස 24 වන දින ප.ව 2.30 ට නිකුත් කරන ලදී.**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය සහ දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා**

**සැලකිලිමත් වන්න!**

**දිවයිනට ගිනිකොණ දෙසින් නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින පහළ වායුගෝලීය කැළඹිලි ස්වභාවය ඉදිරි පැය කිහිපය තුල අඩු පීඩන කලාපයක් දක්වා වර්ධනය විය හැකි අතර එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**




**මුහුදේ තත්වය:**

**ඉහත කී මුහුදු ප්‍රදේශයේ සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල ඉතා තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. පැ.කි.මී. (40-50) ක පමණ තද සුළං සහ විටින් විට හමන පැ.කි.මී. 60 දක්වා වන ඉතා තද සුළං ද සමග එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක.**

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

**නිරිත දිග බෙංගාල බොක්ක සහ දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල යාත්‍රා කරන නාවික සහ ධීවර ප්‍රජාවට ඉදිරි දින කිහිපය තුළ මේ සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙස උපදෙස් දෙනු ලැබේ.**

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි